# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

## இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

## COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION


තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


මාධ්‍ය නිවේදන අංක 2025/104

2025.10.02

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

<u>මාධ්‍ය නිවේදනය</u>

විවිධ සැඟවුණු අරමුණු සහිත ව කටයුතු කරන ඇතැම් පුද්ගලයින් හා ආයතන විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභාව සම්බන්ධයෙන් පදනම් විරහිත සහ නොමග යවන සුළු ප්‍රකාශ විද්‍යුත් මාධ්‍ය, මුද්‍රිත සහ සමාජ මාධ්‍ය ඇතුළු විවිධ ක්‍රම ඔස්සේ ප්‍රචාරය කිරීමේ යෙදී සිටින බව කොමිෂන් සභාව දැඩි කනස්සල්ලෙන් යුතු ව නිරීක්ෂණය කරනු ලබයි. මෙවැනි ක්‍රියා තුලින් කොමිෂන් සභාවේ කීර්ති නාමයට හානි පමුණුවන අතර ම, දැනට සිදු කෙරෙමින් පවතින ප්‍රධාන විමර්ශන වෙතින් ජනතා අවධානය වෙනතකට යොමු කිරීම මෙන් ම කොමිෂන් සභාව විසින් සිදුකරන කටයුතු නීත්‍යානුකූල ව කෙරෙන්නේ ද යන්න සම්බන්ධයෙන් විකෘති සහගත මතයක් නිර්මාණය කිරීමට ද මෙවැනි ක්‍රියා හේතු වේ.

කොමිෂන් සභාව සතු බලය ස්වාධීනව හා බියක් හෝ පක්ෂග්‍රාහීත්වයක් නොමැතිව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතෙන් තමන් වෙත ව්‍යවස්ථාපිත බලතල පවරා ඇති බව අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභාව නැවත වරක් සිහිපත් කර සිටියි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකමක් වන අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, යුත්තිය පසඳලීමට බාධා කරන හෝ දූෂණය පිටු දැකීමේ සටන සම්බන්ධයෙන් මහජනයා තුල ඇති විශ්වාසය අවතක්සේරු කරන පදනම් විරහිත ප්‍රකාශ ප්‍රචාරය කිරීම සඳහා අවභාවිතා කල නොහැකි බව කොමිෂන් සභාව අවධාරණය කර සිටී.

ඒ අනුව, කොමිෂන් සභාව පිලිබඳ වැරදිසහගත ප්‍රචාර සිදු කරන හෝ කොමිෂන් සභාවට හෝ එහි කටයුතුවලට අවමන් කරන පුද්ගලයින් හෝ ආයතන සම්බන්ධයෙන් දූෂණ විරෝධි පනත සහ අදාල අනෙකුත් නීති යටතේ අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කොමිෂන් සභාව පසුබට නොවනු ඇත.

අල්ලස් සහ දූෂණ සම්බන්ධ විමර්ශන කඩිසරව හා අපක්ෂපාතීව නීතියට අනුකූලව සිදු කිරීම සඳහා කොමිෂන් සභාව තුල වූ නොසැලෙන කැපවීම කොමිෂන් සභාව විසින් නැවතත් තහවුරු කර සිටින අතර, මෙම අතිශය වැදගත් කර්තව්‍ය සම්බන්ධයෙන් ජනතාව නොමග යැවීමට සහ ජනතා අවධානය වෙනතට යොමු කිරීමට දරන උත්සාහයන් පිලිබඳ ව අවදියෙන් සිටින ලෙස කොමිෂන් සභාව මහජනතාව ගෙන් ඉල්ලා සිටියි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය
0112502672